**සංශෝධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කළමනාකරණ/අධීක්ෂණ කළමනාකරණ සේවයේ දුම්රිය නියාමක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 (2025)**

අංක 2,424 හා 2025 පෙබරවාරි මස 14 වන සිකුරාදා දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර තිබූ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 යන නිවේදනයේ මාතෘකාව, 1 වන හා 2 වන ඡේද පහත පරිදි සංශෝධනයවන බව මෙයින් නිවේදනය කරමි.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හැර 2025 පෙබරවාරි මස 14 වැනි දිනැතිව පළ වූ අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව කරුණාවෙන් සලකන්න. මේ වන විට අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවන බව ද තවදුරටත් දන්වා සිටිමි.

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කළමනාකරණ/අධීක්ෂණ කළමනාකරණ සේවයේ දුම්රිය නියාමක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 (2025)**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක තනතුරේ පුරප්පාඩු **136ක සංඛ්‍යාවක්** පිරවීම සඳහා 2025.02.14 දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය **2025 වර්ෂයේ ජූලි මාසයේ දී කොළඹ දී** පැවැත්වීමට නියමිතව ඇත.

02. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති " Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් බාර ගැනීම **2025 අප්‍රේල් මස 11** වැනි දින පෙ.ව. **9.00**ට විවෘත වන අතර **2025 අප්‍රේල්** මස **21** වැනි දින **රාත්‍රී 9.00** ට අවසන් වේ.

ජේ. අයි. ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 අප්‍රේල් මස 07 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
අංක 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

04-125